# මනෝ සමාජයීය ප්‍රතිසාධනය පිළිබඳ සංක්ෂිප්ත සටහන

## හැඳින්වීම

**''ඔවුන්ගේ ආදරණීයයන් නැවත ලබාදිය නොහැකිමුත්'' ඔවුන්ගේ සාමය අනිවාර්යයෙන්ම ලබා දියහැකිය**

2014 අප්‍රේල් මාසයේ සිට ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය (NPC) විසින් කාන්තාව සහ සංවර්ධනය සඳහාවූ මණ්ඩපය FOKUS) ආධාර සහිතව පශ්චාත් ගැටුම් සුවපත් කිරීම : කාන්තාවන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශය නැමති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. කාන්තාවන්ගේ ඒකිබද්ධවීම ආරක්ෂා කරගනිමින් සමාජ හා දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා ඔවුන්ගේ සහභාගීත්වය වැඩි කිරීම තුළින් රජය විසින් නායකත්වය දෙනු ලබන සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයට සහාය වීමත්, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා සම්මතය 1325 ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීමත් මෙහි මූලික අරමුණයි.

මෙම ව්‍යාපෘතිය හරහා ජාතික සාම මණ්ඩලය ආමූලික මට්ටමේ අතිශයින් කොන්වීමට ලක්වූ කාන්තාවන් සමග ඍජුවම කටයුතු කොට තිබේ අපගේ ක්‍රියාකාරකම් වල ඉලක්කය වූයේ එකී කාන්තාවන්ගේ හඬට වේදිකාවක් නිර්මාණය කරදීමත් සහ ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වයට අවස්ථාවන් වර්ධනය කිරීමත් වන අතර මේ සියල්ලම පුද්ගලි, ප්‍රජා සහ ජාතික මට්ටමේ සුවපත් කිරීමේ පුළුල් සාකල්‍ය ක්‍රියාවලික් මත පදනම්වී තිබේ මෙම ව්‍යාපෘතිය යුද්ධය නිසා පැහැදිලිවම පීඩනයට ලක්වූ වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලයි, අම්පාර, ගාල්ල, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය සහ පුත්තලම යන දිස්ත්‍රික්ක නවයෙහි ක්‍රියාත්මක කරනු ලබයි.

ආරම්භක අවස්ථාවේ සිටම,මෙම දිස්ත්‍රික්කයන් හී යුද්ධයේ බලපෑමට ලක්වූ ප්‍රජාවන් 900ක් සමග සම්බන්ධතා ගොඩනගාගෙන ඇති අතර ප්‍රජාමූල සංවිධාන, ආගමික නායකයින්, ප්‍රජා නායකයින් සහ ප්‍රාදේශීය රජයේ නිලධාරීන් සමග කටයුතු කොට තිබේ අප විසින් කොන්කිරීමට ලක්වූ 300ක ට අධික කාන්තාවන් පිරිසක් සමග කටයුතු කොට තිබෙන අතර, ඔවුන් අතරින් බොහෝ දෙනෙක් වැන්දඹුවන් සහ/හෝ කාන්තා ගෘහ මූලිකයන් වීම නිසා පශ්චාත් යුධ සංධර්භය තුළ බැහැරකොට තිබීම නම්වූ සුවිශේෂී ගැටළුවට මුහුණ පා තිබේමෙම කාන්තාවන් ගෙන් 72ක් මෙම ව්‍යාපෘතියේ නායිකාවන් ලෙසමතුවී ඉදිරියට පැමිණ තිබේ මෙම කාන්තාවන්විසින් තම දිස්ත්‍රික්කයට අදාලව ප්‍රකාෂ කරණ ලද කරුණු කාරණා නියෝජනය කරමින්, සුවපත් කිරීමේ ක්‍රියාකාරකම් දියත් කිරීම, විරෝධතාවයන්, ප්‍රාදේශීය ප්‍රතිසංස්කරණ, උද්දේශන වේදිකාවන් සහ ශ්‍රී ලංකාවේ යුක්තිය, සමානාත්මතාව හා ප්‍රතිසංධානය සඳහා වඩාත් නියෝජනාත්මක ක්‍රයාවලියක් තහවුරු කිරීම සඳහා අධ්‍යාපනය ලබාදීමේ උත්සාහයන් ද මෙම කාන්තාවන් විසින් සාමූහික ක්‍රියාකාරකම් ලෙස සංවිධානය කොට තිබේ. මෙම ව්‍යාපෘති කාලය තුළ දී කාන්තාවන් විසින් බෙදාගන්නා ලද ගැටුම් වලට සම්බන්ධ අනූපම අත්දැකීම්, දිගින් දිගටම පවත්නා වූ වද හිංසනය පිළිබඳ ගැටළු, අයුක්තිය, අසමානාත්මතාවය, දුක්ගැනවිලි,සහ කොන්කිරීමට ලක්වීම වැනි ඕනෑම සාර්ථක සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය හරහා ආමන්ත්‍රණය කල යුතු දෑ ඉස්මතු කොට දක්වන අතර, මෙමව්‍යාපෘති කාලය තුළ දී උගත් පාඩම් ලදනම් කරගනිමින් සිදු කරනු ලබන නිර්දේශයනුත් මෙම සාරාංශ සටහන තුළින් ඉස්මතු කොට දක්වයි.

මෙම සංක්ෂිප්ත සටහන මගින්, ශ්‍රී ලංකාවේ කාන්තාවන් මුහුණ දෙන අප්‍රසන්න සිදුවීම් වල පැතිර පවත්නා ස්වභාවය සහ ඔවූන්ගේ මනෝසමාජමය ප්‍රතිසාධනයට ඉතා වැදගත් ඉතිරිව තිබෙන ගැටළු පිළිබඳව සාකච්ඡා කෙරේ.

### ක්‍රමවේදය

මෙම ව්‍යාපෘතියේ මූලික ක්‍රම වේදය වන්නේ දැනුවත් කිරීමේ සිට ක්‍රියාත්මක වීම දක්වාත්, සුවපත් කිරීමේ සිට සවිබලගැන්වීම දක්වාත් ක්‍රමිකව නොසැලී ඉදිරියට යෑම සඳහා සහාය ලබාදීමයි සෑමදිස්ත්‍රික්කයකම, අපගේ ප්‍රාදේශීය පාර්ශව කරුවන්ගේ උපකාර සහිතව ජාතික සාම මණ්ඩලය විසින් පහත ක්‍රියාකාරකම් සිදුකොට තිබේ.

1. සංක්‍රාන්තික යුක්තිය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජශාවයසම්බන්ධමානයන්දිස්ත්‍රික්කමට්ටමින්පෙළගැස්වීම් යෝජිත සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන් සහ UNSCR 1325 පිළිබඳව කාන්තාවන්ට හා ප්‍රජා නායකයින්ට අධ්‍යාපනය ලබාදීම සිදුකල අතර, එහිදී ප්‍රජාව අතර මුදුන්පත්ව පවතින සාමය සහ යුක්තිය සඳහා පවතින බාධාවන් පිළිබඳ සමාජයේ ආමූලික මට්ටමේ සිටින කාන්තාවන් විසින් සාකච්ඡා කිරීම, විශේෂ දුක්ගැනවිලි සහයෝගීතාවයෙන් යුතුව හඳුනා ගැනීම, සහ යෝජිත යාන්ත්‍රණය යටතේ ඔවුන්ගේ සැලකිල්ලට භාජනය වන කාරණා ප්‍රමුඛතා ගත කිරීමත් සිදුවිය.

1.District Level Orientations on the Gender Dimensions of Transitional Justice: Education of women and community leaders on the proposed Transitional Justice mechanisms and UNSCR 1325, which culminated in grassroots women discussing obstacles to peace and justice in their communities, collaboratively identifying specific grievances,and prioritising their own areas of concern under the proposed mechanism.

2. සුවපත් කිරීමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා කාන්තා රැස්වීම් ස්වකීය ප්‍රජාව තුළ දී කාන්තාවන්ට ඉතාමත් බරපතල ලෙස මුහුණපෑමට සිදු වන ගැටළු පිළිබඳව සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික්කයකම කොන්වීමට ලක් වූ කාන්තාවන් විසින් සාකච්ඡා කල අතර මෙම කාරණා ආමන්ත්‍රණය කිරීමට සහ පුද්ගල, ප්‍රජා හා ජාතික සුවපත් කිරීම ශක්තිමත් කිරීම සඳහා මුල පිරීමට සැලසුම් කෙරිණි.

3. සුවපත් කිරීමේ ක්‍රියාකාරකම් දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීමට, ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ උද්දේශනය සිදුකිරීමට, සහ සමාජ හා දේශපාලනික කරුණු සම්බන්ධව සාකච්ඡා වැඩිකිරීම උදෙසා, සිවිල් සමාජය, ප්‍රාදේශීය පාලන ආයතන හා ආගමික නායකයන්ගේ සහ ප්‍රජා නායකයන්ගේත් සහයෝගය සහිතව කාන්තාවන්ගේ මූලිකත්වයෙන් යුත් මුල්පිරීම් එක් එක් දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක කිරීම සිදුවිය.

4. අත්දැකීම් හුවමාරු කරගැනීමේ සංචාරයනීඋතුර-දකුණ, දකුණ-නැගෙනහිර, නැගෙනහිර-මධ්‍යම, සහ මධ්‍යම-උතුර අතර සිදු කල උගෙනීම්, සාකච්ඡා සහ හුවමාරු හරහා කාන්තාවන් ජාල ගත කිරීම වැඩිදියුණු කිරීම. කතාන්දර, උගත් පාඩම් සහ අත්දැකිම් හුවමාරුකරගැනීම තුළින් අන්‍යොන්‍ය සවිබලගැන්වීම ශක්තිමත් කිරීම□ සහ සුවපත් කිරීම සහ ප්‍රතිසංස්කරණ කලදී සාමූහික සහභාගීත්වය හරහා ගැටුම් නිසා බෙදුණු ප්‍රජා කණ්ඩායම් අතර අවබෝධය ශක්තිමත් කිරීම සිදුවිය.

යුද්ධය නිසා දෛනිකව සිදුවූ හිංසනයන් හමුවේ දශක ගනණාවක් නිහඬව සිටීමෙන් අනතුරුව මෙම ක්‍රියාකාරකම් හරහා කාන්තාවන්ට තම අදහස් හෙළිදරව් කිරීමට පුළුල් ඉඩකඩක් නිර්මාණය කර තිබුණි. හා තම ආදරණීයයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, රාජ්‍ය සේවාවන් කබාගැනීමට ඇති සීමාකම්, වාර්ගිකත්වය ආගම භාෂාව පදනම් කරගෙන සිදුකරන ලද බැහැරකරවීම, දිගින් දිගමට සිදුවන අනේකවිධ අයිතීන් උල්ලංඝනය වීම්, උග්‍ර දිළිඳු බව, කෙල්ලකෑමේ ස්වරූපයෙන් ණය දීම, ලිංග භේදය පදනම් කරගත් හිංසනයන්, ළමා අපචාර, වැන්දඹුවන්ට සහ කාන්තා ගෘහමූලික පවුල් වලට සමාජ හිංසනය එරෙහිව සිදුවන අඩන්තේට්ටම් ඇතුළු මෙරටෙහි සාමය, ප්‍රජාතන්ත්‍රවාදය සහ යුක්තියට අභියෝග ගණනාවක් ඔවුන්ගේ පෞද්ගලික අත්දැකීම් තුළින් ඔවුන් විසින් හඳුනාගන්නා ලදී.

මෙම ව්‍යාපෘතිය තුළින් ලත් පාඩම් තෝරාගත් දිස්ත්‍රික්ක 9කින් පමණක් වන අතර, විස්තරාත්මකව දැනගැනීම සඳහා තවදුරටත් අධ්‍යයනය කිරීම අවශ්‍යයි. ඒවා ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සමය තුළ කාන්තාවන් මුහුණදුන් අභියෝග හා අත්දැකීම් පිළිබඳ වැදගත් ආඛ්‍යානයක් ලෙස පවතිනු ඇති අතර ජාතියේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය තුළ කාන්තා පුරවැසියන්ගේ ඉල්ලීම් නියෝජනය කරයි.

## මනෝසමාජයීය ප්‍රතිසාධනය

සංක්‍රාන්තික යුක්තියේ අවියෝජනීය කොටසක් ලෙස මානසික ප්‍රතිසාධනය ප්‍රධාන තුළ පවතියි. ප්‍රචණ්ඩත්වයේ ප්‍රමාණය සහ පුළුල් ලෙස එයට නිරාවරණය වීම, එදිනෙදා ජීවිතයේ අනාරක්ෂිතභාවය, ලංකාවේ පැවති දීර්ඝකාලීන සිවිල් යුද්ධයේ යටින් තිබූ ස්වභාවයත්, ජන ප්‍රජාව භේදබින්න කරවීමට සහ පුද්ගල සිත්හි වේදනාත්මක කැළැල් ඉතිරි කොට තිබේ මෙවැනි දරුණු ගැටුම්වලට මුහුණදුන් අනෙකුත් රටවල් පිළිබඳව අධ්‍යයන් සඳහන් කරනුයේ, එවන් ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ බලපෑම වේදනාව දිගටම පැවතීමට බලපෑම් කිරීම සහ ගැටුම් අවසන්වී කලකට පසුවත් සමාජ ප්‍රතිසාධනය අස්ථාවර කිරීම





සිදු කරන බව, සහ පස්චාත් යුධ සමය තුළ නැවත ගොඩනැගීම් කාලය තුළ දී සමාජ දේශපාලන කටයුතු වල විනාශකාරී රටාවකට මූලික විය හැකි බවයී ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති අභ්‍යාසය තුළජාතික සුවපත් කිරීමේ කර්තව්‍යය බලපෑමට ලක්වූ පුද්ගලයින්ගේ මනෝ සමාජයීය ප්‍රතිසාධනය, මෙන්ම මෙම පුද්ගලයින් තම ජීවිතය නැවත සකස් කර ගන්නා තැළුණු ප්‍රජාවන් වෙත දක්වන අවධානය මත රැඳී පවතියි.

මෙම ව්‍යාපෘතියට අදාළ කරගත් කාන්තාවන්ගේ ලද වාචික සාක්ෂිවලට අනුව පෙන්නුම් කරනුයේ ඍජුවම ප්‍රචණ්ඩත්වයෙහි බලපෑමට ලක්වූන් හෝ ක්‍රියාකාරී ලෙස ගැටුම් සිදුවූ භූගෝලීය ප්‍රදේශ වල ට පමණක් අප්‍රසන්න සිදුවීම් සීමා නොවූ බවයී අනෙක් අතට, මෙම ව්‍යාපෘතියේ එක් එක් දිස්ත්‍රික්කයන් තුළ එවන් සිද්ධීන් විස්තර කොට තිබෙන නමුත් එක් එක් ප්‍රදේශ වෙනස්ව සැළකිල්ලට භාජනය කරන කාරණා වලට ඇත්ත වශයෙන්ම මුහුණ දෙයි. මෙම සංක්ෂිප්තය ශ්‍රී ලංකාවේ ගැටුම් හේතු කොටගෙන ඇතිවූ කම්පනයන් සම්බන්ධ සිද්ධීන් හෝ ස්වභාවයන් පිළිබඳව සාකච්ඡා නොකරන අතර, එය වෙනත් ස්ථානයක සවිස්තරාත්මකව පිරික්සා තිබේ. ඒ වෙනුවට කොන් කිරීමට ලක්වූ කාන්තාවන් සිවිල් ජීවිතය තුළ පූර්ණ වශයෙන් සහභාගීවීම පිණිස ගැටුම් තුළින් ප්‍රකෘති ස්වභාවයට පැමිණීමට උත්සාහ කරන අතරතුර ඔවුන්ගේ ජීවිතවලට ඇති මානසික සහ සමාජයීය බලපෑම සාකච්ඡා කරයි. එක් එක් දිස්ත්‍රක්කයක් පුරා මනෝසමාජමය සෞඛ්‍යයට අදාල නැවත නැවත සිදුවන රටාවන් පිළිබඳව සටහන් කරයි; සහ මෙම ව්‍යාපෘතිය පවතින කාලය තුළ සිදුකරනු ලැබූ ක්‍රියාකාරකම් අතරතුර කාන්තාවන් විසින් ලබා දුන් තොරතුරු පදනම් කරගනිමින් නිර්දේශයන් ඉදිරිපත් කරයි.

## කොන්වීමට ලක්වූ කාන්තාවන් අතර පවතින මනෝසමාජයීය ප්‍රතිසාධනයට බලපාන ගැටළු

සිතෙහි කම්පනයන් ඇතිකරවන ප්‍රචණ්ඩ ක්‍රියා වලින් යථාතත්ත්වයට පත්වීම අවස්ථා 3ක් යටතේ සිදුවෙයි. පළමුවැන්න ආරක්ෂාව ස්ථාපිත කිරීමයි, දෙවැන්න අනුස්මරණය සහ ශෝකවීම, සහ තෙවැන්න සාමාන්‍ය ජීවිතය සමග නැවත සම්බන්ධවීමයි. මම අවධින් සැමවිටම රේඛීයව ඉදිරියට යෑම සිදු නොවන ඒවා උපරිපතනය වෙයි; එහෙත්, සමස්ථයක් ලෙස එක් එක් අවධීන් එක් අවධිකට පෙර පැමිණෙන අවධිය මත අනුමාන කරයි. ශ්‍රී ලංකාව වැදගත් කර්තව්‍යයක් වන සංක්‍රාන්තික යුක්තිය ආරම්භ කරනු ලබන නිසා, මෙම අවධීන් රටෙහි සමස්ථයක් ලෙස ප්‍රතිසාධන සැලසුම් පිළිඹිබු කරයි. කෙසේ වුවද ව්‍යාපෘතියේ වාර්තා අනුව පෙනීයන්නේ බොහෝ කාන්තාවන් තවමත් පළමු අවධියෙහි සිරවී සිටින අතර, ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව සංස්කෘතිය ඔවුන්ගේ දෛනික ජීවිතය පුරා පැතිරීම නිසා ඉදිරියට යා නොහැකි වී ඇත.

## 1. ගැටුම් පැවති අවධියේ සිට දිගින් දිගමට පවතින ප්‍රචණ්ඩත්වය

පෙර යුද්ධය පැවති ප්‍රදේශවල (වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, අම්පාර) කාන්තාවන් ප්‍රකාශ කර සිටියේ යුදිධයෙන් පසු ගමන් කිරීමේ නිඳහස, ක්‍රියාකාරී ගැටුම් විරාම වී කිබීම වැනි දෑ සම්බන්ධයෙන්වඩාත් වර්ධනීය ලක්ෂණයන් පෙන්නුම් කළ ද තවදුරටත් ගැටුමේ ප්‍රචණ්ඩත්වය තව දුරටත් තමන්ගේ ප්‍රජාව කඩා බිඳ දමන බවයි. අතීතයේ ඇතිවූ පැහැරගැනීම්,බලහත්කරයන් අතුරුදහන්කිරීම්, හා නීතියේ බැහැරව සිදුකල මනුෂ්‍ය ඝාතන, ස්ත්‍රී දූෂණ, වද හිංසන නිසා පවුල් අරගල කරන අතර හමුදාව විවිධ කටයුතු කල නිරතවීම නිසා ඇතිව තිබෙන පීඩණය, LTTE සංවිධානයේ අභ්‍යන්තර පරීක්ෂාවට ලක්වීම, දීර්ඝකාලීනව අවතැන්වී සිටීම, සහ ආගමික ප්‍රචණ්ඩත්වය (ආගමික ස්ථාන විනාශ කිරීම, මුස්ලිම් ජාතිකයින්ට යාඥා කිරීම් අතරතුර සිදුවූ ඝාතන පිළිබඳ මතකයන්) නිසා ප්‍රජාව කඩාවැටීමකට ලක්ව තිබේ. LTTE ය සමග අවසන් සටන් බිමෙහි කොටුවී සිටි අයට කෲර සහ විනාෂකාරී ප්‍රචණ්ඩත්ව කාල සීමාවක අත්දැකීම් ඇති නිසා විශේෂයෙන්ම කම්පනයන් ඇතිකරන මතකයන්ට මුහුණ දී සිටිති.

යුද්ධය නිම වී සත්වසරක් ගත වු පසුවද, අද වන විට කිහිපාකාරයක ප්‍රචණ්ඩක්‍රියා හා ගැටුම් හේතුවෙන් සිදුවන අහිමිවීම් තවදුරටත් දිගින් දිගටම සිදුවෙමින් පවතීයී නැවත පදිංචිකිරීම් වලක්වන, අසමානතාවය පිළිබඳ ඔවුන්ගේ හැඟීම් තවදුරටත් සිතට කාවද්දන සහ නීතියේ ආධිපත්‍යය යටපත් කරවන පරිදි හමුදාව හෝ දේශපාලන නායකයින් විසින් සිදුකරන දේපල අයිතිකර ගැනීම වැනි දෑ පිළිබඳව කාන්තාවෝ සාකච්ඡා කරති. අම්පාර, වවුනියාව, මන්නාරම ආදී දිස්ත්‍රික්කවල දිගින්දිගමට පොලිසිය, හමුදාව සහ ඉඳහිට අනන්‍යතාවය තහවුරු නොකල පුද්ගලයන්ගේ පැමිණීම සහ ඉන පසු පවුලේ සාමාජිකයින් ප්‍රශ්න කිරීම සඳහා රැගෙන යෑම පිළිබඳවකාන්තාවන් විස්තර කරයී මෙම ප්‍රශ්ණ කිරීම් අතරතුර ලිංගික

4. Herman, Judith. Trauma and Recovery. New York: Basic Books, 1997. p. 155

5. Human Rights Watch. "We Will Teach You a Lesson: Sexual Violence Against Tamils by Sri Lankan Security Forces", February 2013 https://www.hrw.org/report/2013/02/26/we-will-teach-you-lesson/sexual-violence-against-tamils-sri-lankan-security-forces

අතවර හා අපචාරයන් සිදුවියහැකියයි ඇති-වන බිය මෙම ප්‍රජාවන් අතර බහුලව පවතියි.

තවත් ආකාරයක ගැටුම් නිසා පොළඹවන ලද මානසිකව පීඩාවට පත් කිරීමක් වන්නේ තම ආදරණීයයන් අතුරුදහන් වීම නිසා ඇතිවී තිබෙනඅනුකම්පා විරහිත වේදනාවයි. උතුරසහ නැගෙනහිර ප්‍රදේශවල විසූ කාන්තාවන් එම ප්‍රදේශවල සිදුවූ අතුරුදන්වීම් පිළිබඳව වාර්තා කොට තිබේ. ඔවුන්ගේ ඉරණම පිළිබඳ සත්‍ය හෙළිදරව් කිරීමේප්‍රගතිය ඉතාම මන්දගාමී ලෙස සිදුවේ. තත්ත්වයේ පවතින අවිනිශ්චිත භාවය බලාපොරොත්තු සුන්වීම සහ පිළිතුරු නොමැති බලාපොරොත්තු අතර නිමාවක් නොවන දෝලනය නිසා අතුරුදන් වූවන්ගේ පවුල් උගුලක සිරවී සිටිති. එහිදී යථාතත්ත්වයට පත්වීම සඳහා තවමත් ප්‍රත්‍යක්ෂලෙස කිසිවක් නොමැති හෙයින් මෙමගින් සැලකියයුතු මනෝසමාජයීය බලපෑමක් තිබියහැකි අතර ප්‍රතිසාධන කටයුත්ත දෙසට මෙම පවුල්වල සාමාජිකයන් ගමන්කිරීම වලක්වාලයි. වවුනියා දිස්ත්‍රික්කය නියෝජනය කළ මවකගේ වාචික සාක්ෂි පෙන්වාදෙන අන්දමට. මෙම අප්‍රසන්න අතීතය මත බද්ධවී සිටීම ඔවුන්ගේ අතුරුදන්වූ ආදරනීයයන් නැවත පැමිණීමේ හැකියාවක් ඇතැයි යන්නට ජීවය ලබා දෙන්නක් නිසා, අතුරුදන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින් සංක්‍රාන්තික යුක්තිය වැනි ජාතික ප්‍රතිසංස්කරණ ක්‍රමවේද වලින් පසුබැස සිටීමට මඟ පෙන්වන බවයි.





"මම දරුවන් දෙදෙනෙකුගේ මවක්; මගේ දියණිය විවාහ වී දුර බැහැර ජීවත් වෙනවා. මම සහ මගේ සැමියා වයස හැත්තෑ ගණන් වල පසුවන අතර අප විසින්ම දිවිපැවැත්ම සකස්කර ගන්නවා. අප නොනැසී ජීවත්වීම සඳහා කෘෂිකර්මාන්තයේ නියැලෙනවා. අප දෙදෙනාම රෝගීන් වුවත්, තවමත් ගොවිතැන හැර වෙනත් ආදායම් මාර්ගයක් සොයාගැනීමට නොහැකි-වුනා. අපව රැක බලාගත් මගේ එකම පුත්‍රයාව යුද සමයේ දී හමුදාව විසින් රැගෙන ගිය අතර අපට ඔහුව නැවත දකින්නට ලැබුණේ නැහැ. ඔහුව රඳවා තබා ඇතැයි ආරංචි වූ සියලු ස්ථානවලට අපි දිගින් දිගටම ගොස් සොයා බැලුවා. මගේ එකම ඉල්ලීම වන්ටන් අප මියයාමට පෙර නැවත මගේ පුත්‍රයා ලබාදෙන්න කියන එකයි. මගේ පුත්‍රයා මැරුණා හෝ මැරුවා හෝ යන්න ඇසීමට මට කවදාවත්ම වුවමනා නැහැ, එමෙන්ම ඒ සඳහා යුක්තිය ඉටුවුණා යැයි ඇසීමට මට කවදාවත්ම වුවමනා නැහැ. ඔබ එය සත්‍ය බව මට පවසීමට සිටින්නේ නම්, එම සත්‍යය ඇසීමටමට ඇසීමට වුවමනා නැහැ, මන්ද ඒ මොහොතේ මා මියයනු ඇති නිසා. ඔහු මියගිය බව විශ්වාස කරනවාට වඩා ඔහු කොහේ හෝ ජීවත්වනවා යැයි සිතා මියයාමට මම කැමතියි.

-වවුනියාවේ දමිළ කාන්තාවක්-

සංක්‍රාන්තික යුක්තියේ බරපතල කටයුත්තක් වන්නේ අනියතාකාර සත්‍යයක් නොනවත්වා පවත්වාගෙන යැමෙන් ප්‍රජාවන් නිදහස් කර ගැනීමයි. වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලයල, අම්පාර, පුත්තලම සහ මහනුවර නියෝජනය කළ දමිළ හා මුස්ලිම් කාන්තාවන් දිගින් දිගටම ප්‍රකාශ කරන ලද්දේ ඔවුන්ගේ ප්‍රජාව මුහුණදුන් ප්‍රචණ්ඩත්වය, පාඩුව සහ අයුක්තිය සඟවන, හෝ වඩාත් නරක ලෙස පවතින මෙන්ම, දිගින් දිගටම ප්‍රතික්ෂේප කරණ බවයි. මෑත අතීතය පිළිබඳව විශ්වාසදායී ජාතික ආඛ්‍යානයක් ඔවුන්ට ඒවා අසන්නට සැලැස්වීමට හා ඒත්තුගැන්වීමට ඔවුන් තමන්ගේ මෑත අතීතය පිළිබඳව ප්‍රසිද්ධියේ කථා කිරීමට ඇති ගැඹුරු අවශ්‍යතාවය අවධාරණය කරයි. සියලුම ප්‍රජාවන් එකඟවන ගැටුම් පිළිබඳ නිවැරදි අපක්ෂපාතී වාර්තාවක් සකස් කිරීමට සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයටහැකිවනතෙක්, සුළු ජාතීන්ට තම අත්දැකීම් ජීවමානව තබාගන්නා සාමූහික මතකය නොනැසී පවත්වාගෙන යෑමේ බර දැනෙනු ඇතිඔවුන්ගේ අත්දැකීම් පිළිබඳ සත්‍යය පිළිගැනීම අනෙක් අතට පීඩාවට පත්වූවන්ට සහ ප්‍රජාවට ඔවුන්ගේ ප්‍රතිසාධනය සඳහා පරපතළ ලෙස වැදගත්වන හැඟීමක් වන නිමාව නම් වූ හැඟීම ලබාදෙයි. මෙය අම්පාර දිස්ත්‍රික්කයේ කාන්තාවක් තම මනුෂ්‍යත්වයේ හැඟීම විනාශවීමෙන් බේරාගැනීමට ඉඩ ලබාදෙන දෙය කුමක් ද යන්න ඉදිරිපත් කල ආකාරයයි.

## 2. කාන්තාවන්ට සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව නොමැතිකම්

ගැටුම් හේතුවෙන් සෘජුවම හටගනු ලැබූ ප්‍රචණ්ඩත්වයට අමතරව, ඔවුන් අනාරක්ෂිත බවට හැඟීමක් ඇතිකල, ඔවුන්ගේ ප්‍රජාවන් තුළ දිගින් දිගටම පැවති ලිංගිකත්වය මත පදනම් වූ වද හිංසන පිළිබඳ සෑම දිස්ත්‍රික්කයකම පාහේ කාන්තාවෝ වාර්තා කලහ.

යුද්ධයෙන් පසුව සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබෙන ලිංගික වද හිංසනයන් දිගින් දිගටම පැවතීම පිළබඳව සෑම දිස්ත්‍රික්කයක්ම කතා කලහ. ඉහළ මට්ටමේ සිදුවීම් වන යාපනයේ පාසැල් ශිෂ්‍යාවක වූ එස්. විද්‍යා ට සිදු කරණ ලද සමූහ ස්ත්‍රී දූෂණය, මෙන්ම සමස්ථයක් ලෙස දිනපතා වාර්තා වන ස්ත්‍රී දූෂණ පිළිබඳ පුවත්, ළමා අපයෝජන, මාධ්‍යය තුළ සිදුවන ස්ත්‍රී දූෂණ, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අතරතුර සිදුවූ සාකච්ඡාවල දී සැළකියයුතු අවධානයට ලක්වූ මූලාශ්‍රයන් යී ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වූ මෙම ජාතික කතිකාවත සහභාගී වූ කාන්තාවන් තුළ ප්‍රබල හැඟීම් පුබුදු කිරීමට සමත් වූයේ ඔවුන්ගෙම ප්‍රජාවන් තුළ මෙම අවදානමේ ප්‍රතිබිම්භය දැකීම නිසාවෙනි. මෙම දිස්ත්‍රික්ක වල ලිංගික ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ ප්‍රබල සංස්කෘතියක් පවතින අතර කාන්තා ශරීරයන්ට පුරුෂයන්ගේ ඇති අයිතිය පවුලේ සාමාජිකයන්, සමාජ ව්‍යවහාරයන් සහ අධිකරණ ක්‍රමය මගින් පිළිගෙන තිබේ එහෙයින් කාන්තාවන් දිගින් දිගටම බිය හා අනාරක්ෂිතබව යන හැඟීම තුළ ජීවත්වන අතර එය පහසුවෙන් ඉවත ලිය නොහැකියි.

මෙම ප්‍රචණ්ඩත්වයේ සංස්කෘතිය තුළ පැවැත්ම පිළබඳ මානසික පීඩණය සම්මිශ්‍රනය වී පවතින්නේ කුමක් ද යත් ස්ත්‍රී දූෂණ පහසුවෙන් නම් කිරීමට නොහැකි වීමයි. පවත්නා මෙවැනි තත්ත්වයන් තුළ දී ලිංගික දූෂකයින් නම් කිරීම, අපහසු වීම, මානසික පීඩාව උග්‍ර කරන්නෙකි. පවිත්‍රභාවය, නින්දාවක් ඇතිවේයැයි යන බිය සහ චූදිතයින්ට දොස් පැවරීමක් නොමැතිවීම වැනි සමාජ සම්මතයන් කාන්තාවන් ඒ සම්බන්ධයෙන් වලක්වන්නේ කෙසේද යන්න පිළිබඳව සියලු ලඝාත් වල කාන්තාවෝ කථා කලහ. වින්දිතයෙක් විසින් අවදානමේ අපවාදය දරාගෙන අවස්ථාව වාර්තා කිරීමට උත්සාහ ගත්තද, කාන්තාවන් පැවසුවේ ඔවුන්ට අධිකරණ ක්‍රමයේ පිහිට ආරක්ෂාව ලබාගැනීම අසම්භාව්‍ය බවයී රෝහල් සේවකයන්ගේ හා පොලිස් නිලධාරීන්අතර පුහුණුවීම් වල බරපතළ අඩුපාඩුවක් පවතින අතර, රජයෙන් යුක්තිය අපේක්ෂා කිරීමේ දී පළමුවෙන්ම සම්බන්ධවන ස්ථාන මේවා බැවින් මෙම තත්ත්වය ඉතා ගැටළුකාරී වේ ඔවුන් චූදිතයින්ට පැමිණෙන ලෙසට ආරාධනා කරන්නට ඇතැයි, හෝ චරිතයෙහ් ඇති අඩුපාඩු නිසා මෙම ලිංගික ප්‍රචණ්ඩත්වය ඇයට උරුම බව වැනි අමතර අවමාණයන් රාජ්‍ය ක්‍රමවේදය තුළින් අපේක්ෂා කරන්නට වින්දිතයින් පාඩම් උගෙන තිබේ. චූදිතයින් සම්බන්ධයෙන් විභාග නොපැවැත්වීම, හෝ කඩිනම් විභාගයකින් පසුව නිදහස් කිරීම සිදුවන විට ඔවුන්ගේ ආරක්ෂාව තවදුරටත් අමාරුවේ හෙලයි. ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා වල ගොදුරක් වුවත්, තවදුරටත් නිහඬකරන, චූදිතයා හෝ ඔහුගේ මිතුරන් විසින් පළිගනීවි යැයි යන බිය පිළිබඳව කාන්තාවන් විසින් කථා කලහ.

මේ නිසා, වින්දිත කාන්තාවන් තම මානසික කම්පනය සහ නින්දාව අභ්‍යන්තරයේම තබාගැනීමට පෙළඹෙති. මෙම අපරාධ හෙළිදරව් කිරීමට ඇති නොහැකියාව යනු ඔවුන්ට මෙම මානසික කම්පන අත්දැකීම මැඩපැවැත්වීමට උපකාර වියහැකි උපදේශණය හෝ වෙනත් ආකාරයක මනෝවිද්‍යාත්මක සහනයක් ලබාගැනීමට ඇති අවස්ථාව ප්‍රතික්ෂේප කිරීමයි. ත්‍රිණාමලයේ කාන්තාවන් ඔවුන්ගේ ප්‍රජාවන් තුළදූෂණයට ලක් වූ ගැහැණු දරුවන් හෝ කාන්තාවන් පිළිබඳව පෞද්ගලිකවම දැනසිටි නමුත් සමාජයෙන් එල්ලවන පීඩනය නිසා කරුණු යටපත් කරගෙන සිටිති යුක්තිය පසිඳලීමට භාජනය නොවුණු ලිංගික ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ නඩු පිළිබඳ සිද්ධීන් වවුනියාව දිස්ත්‍රික්කය තුළ ඉහළ අගයක් ගන්නා අතර, වින්දිතයින්ට යුක්තිය ඉල්ලා විරෝධතාවයක් කාන්තාවන් විසින් සංවිධානය කළහ. මන්නාරම ප්‍රදේශයේ, රජය විසින් වින්දිතයින් අසමර්ථ කරන ලද අවස්ථා පිළිබඳවකාන්තාවන් විසින් වාර්තා කරණ ලදි.

"වයස අවුරුදු 42ක පුරුෂයෙකු අතින් 14 හැවිරිදි දැරියක අපයෝජනයට ලක් විය. ඒ සම්බන්ධ නඩුව ඇයට අවුරුදු 16ක් වන තෙක් කල් ඇදීම නිසා අවසානයේ ළමා ආරක්ෂක අධිකාරිවරයා ප්‍රකාශකර සිටියේ දැරිය අවුරුදු 16 සපුරා සිටින බැවින්, තවදුරටත් එය නීත්‍යානුකූලව ස්ත්‍රී දූෂණයක් නොවන බවයි''.

කාන්තා ශරීරයට ඇති අයිතිය ලිංගිකත්වය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ අනෙකුත් අවස්ථාවන් ගණනාවකට බලපෑම් කරයි. අම්පාර, වවුනියාව, නුවරඑළිය යන දිස්ත්‍රික්කවල බලහත්කාරයෙන් සිදුකරණ ලද ගබ්සා කිරීම් සහ වදභාවයට පත්කිරීම් පිළිබඳව කාන්තාවන් විසින් වාර්ථා කරන ලදි. මේ සෑම දිස්ත්‍රික්කයක් තුළම බහුල වශයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් ඉහළ මට්ටමක පවතියී හිරිහැර කිරීම්, අනවශ්‍යය ලිංගික ආක්‍රමණ සහ ලිංගික අඩන්තේට්ටම් හා සම්බන්ධ තර්ජන නිසාවෙන් පොදු ස්ථාන ද කාන්තාවන්ට අනාරක්ෂිත ස්ථාන ලෙස සැළකේ මෙනිසා පොදු මෙන්ම පුද්ගලික ස්ථානයන දෙකෙහිදීම දිගින් දිගටම කාන්තාවන් අනාරක්ෂිත තත්ත්වයට පත්වී ඇත. මෙය යමෙකුගේ පුද්ගල අවංකභාවය අනතුරේ හෙලන අතර දිනපතා ජීවිතය බිය සහ ප්‍රචණ්ඩත්වය තුළ ගිලී පවතින නිසා මෙය ප්‍රතිසාධන දෙසට ඇති ඕනෑම ප්‍රගතියක් වලක්වාලයි.





## 3. වැන්දඹු කාන්තාවන්ට එරෙහිව සිදුවන සමාජ ප්‍රචණ්ඩත්වය

සියලු දිස්ත්‍රික්ක වල වැන්දඹුවන් යුද්ධයෙන් පසුව තම ජීවිත නැවත සකස් කර ගැනීමට උත්සාහ දරණ නිසා, සැළකිය යුතු පීඩණයන්ට පත්ව සිටිති. මෙම ව්‍යාපෘතියට සහභාගී වූ වැන්දඹුවන් ඔවුන්ගේ මනසෙහි සාමකාමී බව ආරක්‍ෂාකර ගැනීම උදෙසා මුහුණපාන අභියෝග ගණනාවක් පිළිබඳව වාර්ථා කරණ ලදී. මූලිකව ඉපැයීම් කල තැනැත්තා අහිමි වීමෙන් පසුව ඇතිවූ ආර්ථිකමය වශයෙන් පහසුවෙන් පීඩාවට පත්විය හැකි බව සහ ජීවන වෘත්තීන් පිළිබඳ ප්‍රමාණවත් දක්‍ෂතාවයක් නොමැතිව ඔවුන්ගේ දරුවන් රැකබලා ගැනීමට ඇති පීඩණය; ඔවුන්ගේ ස්වාමි පුරුෂයින් මියයැම හේතු කොටගෙන ඔවුන්ට ඉඩම් හා දේපල වලට ඇති උරුමය අහිමි වීම නිසා ඔවුන්ගේ නිවාස වලින් ඉවත් වීමට සිදුවීම; රාජ්‍ය නිළධාරීන් සහ ආරක්‍ෂක හමුදා සමග ගනු දෙනු කිරීමේ දී ලිංගික ආක්‍රමණ සිදුවීමට ඇති හැකියාව; වැන්දඹුවන් ලිංගික කටයුතු වලට යොදාගත හැකියයි පවතින ආකල්ප නිසා පොදු ස්ථාන වලදී මෙන්ම පවුලේ පිරිමි සාමාජිකයින් යන දෙකොට්ඨාශය වෙතින්ම ඔවුන්ගේ ආරක්‍ෂාව තර්ජනයට ලක්වීම; ඔවුන්ගේ පවුල්වල අය මෙන්ම සමාජය විසින් ද ඇය තම ස්වාමියා මරාගත් අවාසනාවන්ත අයෙකු ලෙස හංවඩු ගැසීම; මූල්‍යමය වශයෙන් බරක් වී සිටීම; හෝ ව්‍යභි සංවාසය පිළිබඳ අසත්‍ය චෝදනා නැඟීම; ගමන් බිමන් යෑමේ නිදහස ඔවුනට අහිමි වීම; සහ සමාජය විසින් ඇය පිළිබඳව සෝදිසියෙන් සිටීම මෙයට ඇතුළත්ය.

වැන්දඹු භාවයේ සමාජ අත්දැකීම්, වියෝවීම නිසා ඇතිවූ මානසික වේදනාවට සහ තම ස්වාමියා වියෝ වීමේ මානසික කම්පනයට අවධානය යොමු වීම වලක්වයි. ගැටුමෙහි අනෙකුත් වින්දිතයින්ට නිතරම ඉඩ කඩ හිමිවීම නිසා, සමාජය තුළ වැන්දඹුවන්ට තම හැඟීම් එල කිරීමට හෝ ඔවුන්ගේ වේදනාවන්ට පිළිගැනීමක් ලබා ගැනීමට එහි ඉඩක් නොමැත. සිවිල් සමාජය තුළ වැන්දඹුවන්ගේ සහ ස්ත්‍රී ගෘහමූලිකයින්ගේ මනෝසමාජ අවශ්‍යතායන් පිළිබඳ දැනුවත් වී තිබියදීත්, බලපෑමට ලක්වූ කාන්තාවන් උදෙසා උපදේශණ සේවාවන් පහසුවෙන් ලබාගතහැකි පරිදි ප්‍රමාණවත් ලෙස දිවයින පුරා පිහිටා නැත.

එහි ප්‍රතිඵලයක් ලෙස වැන්දඹුවන් විසින් මානසික විශාදය සම්බන්ධ රෝග ලක්‍ෂණ ගණනාවක් වාර්ථා කරයි. වේදනාබර මතකයන් තුළ සිරව සිටීම, හඬා වැටීම වලක්වා ගැනීමට නොහැකි වී සිටීම, ඔවුන් විසින්ම හුදකලාවීම, පවුලෙන් ඈත්වීම සහ ඔවුන්ගේ දරුවන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා සිත යොමු කිරීමට නොහැකිව සිටීම, භාවාත්මක හැඟීම් නොදැනීම, හීනමාන ඇතිවීම, අසරණයැයි හැඟීම වැනි මානසික රෝග ලක්ෂණ ගණනාවක් පිළිබඳව ඔවුන් විසින් වාර්තා කොට ඇත. හම්බන්තොට ප්‍රදේශයෙන් වැඩසටහනට සම්බන්ධ වූ සෑම කාන්තාවක්ම මානසික විශාද ලක්‍ෂණ ප්‍රකට කළහ. සැමදා ජීවිතය තුළ මුහුණ දෙන මෙම වැන්දඹුවන් මත ඇති මානසික පීඩණය සමග සම්බන්ධ වූ දඬුවම් කිරීමේ සමාජ ආකල්ප, හේතුවෙන් බලපෑමට ලක් වූ කාන්තාවන්ට තමාගේම දුක් වේදනා ඒත්තු ගැනීමට නොහැකි වී තිබීම හා එය ඉතාමත් අඩුවෙන් පැහැදිළි කිරීම හෝ අඩුවෙන් මනෝ සමාජ ප්‍රතිකාර සෙවීම ප්‍රතිඵලය වී තිබේ. වැන්දඹුවන් තුළ ආතතිය, සාංකාව, පසු කම්පන මානසික ආතති ආබාධය, කම්පන විශාදය සහ අනෙකුත් ආකාර වල සිතෙහි ඇතිවන කම්පන තත්ත්වයන් වැනි රෝග තත්ත්වයන් මෙසේ නොපෙනී හෝ නොවිසඳා තිබේ.

6. Erikson, Kai. “Notes on Trauma and Community.” In Trauma: Explorations in Memory, edited by Cathy Caruth, 183-299. Baltimore and London: Johns Hopkins University Press, 1995. p.185

Farmer, Paul. “On Suffering and Structural Violence.” Daedalus 125, no. 01 (1996): 261-83. P.263

"වැන්දඹුව යන වචනය අපව බොහෝ සීමාවන් හා මානසික බාධාවන් යටතේදමා තිබෙනවා. ඉන් එහාට යෑමට නොහැකියැයි අපට හැඟෙනවා."

-හම්බන්තොට හමුදා වැන්දඹුවක්-

## 4. ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය සහ බල රහිත කිරීම

කායි එරික්සන් ඔහුගේ සිතෙහි කම්පන තත්ත්ව ඇතිකරනු ලබන සිද්ධීන් ගෙන් ප්‍රතිසාධනය වෙමින් පවතින ප්‍රජාව සම්බන්ධයෙන් කරණ ලද පර්යේෂණයේ දී සඳහන් කරන්නේ සිද්ධිය" ජීවිත අත්දැකීම් වල සම්මංජරියක් මෙන්ම වෙන් වෙන්ව පවත්නා සිද්ධි, නිබඳවම ඇතිවන තත්ත්වයක් මෙන්ම දරුණු සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස හඳුනා ගත යුතු බවයි. ප්‍රචණ්ඩත්වයට සමාජයීය හා ව්‍යුහාත්මක මුක්කු ගසන දිළිඳු බව, වාර්ගිකත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවය වැනි දෑ මෙලෙස මානසික සෞඛ්‍යයට බලපායි; හෝ පෝල් ෆාමර් ඉදිරිපත් කරණ අන්දමට, "පුද්ගල පීඩාවන් තියුණු සංඝෘෂ්ඨයන්ට කැටිකරන මහාපරිමාණ සමාජ බලවේගය."

කායික සම්පූර්ණත්වය මානසික සෞඛ්‍ය සඳහා ඉතා වැදගත් වේ. කාන්තාවන් විසින් සෞඛ්‍යය සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් ඔවුනට ඇති අයිතිය පිළිබඳ නිරතුරු කතාබහ කලහඃ ග්‍රාමීය ප්‍රජාවන්ට සෞඛ්‍යය සේවා ලබාගැනීමට ඇති අපහසුතාවයන්, භාෂාමය ගැටළු නිසා දරුවන්ගේ සෞඛ්‍යයට අහිතකර ලෙස බලපාන වැරදි ක්‍රියාමාර්ගයන්; මන්දපෝෂණය, ගර්භණී සමය තුළ සිදුවන අවිධිමත් හා නොසැලකිලිමත් හුරුපුරුදු යනාදිය විවිධ දිස්ත්‍රික්කවල කැපී පෙනුණි. මෙම කරුණු සමඟම, දරිද්‍රතාවය සහ සමාජ දේශපාලනික වශයෙන් කොන්වීම ලක්වූ වතුකරයේ කාන්තාවන්ගේ යහපැවැත්මට සම්බන්ධයෙන් බරපතළ ප්‍රතිඵල ඇතිකොට තිබෙන අතර ළදරු හා මාතෘ මරණ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතුකර කාන්තාවන් අතර අවුල් සහගත බනක් ඇතිකිරීමට හේතු වී තිබේ.

සෑම දිස්ත්‍රික්කයකම පාහේ කාන්තාවන් විසින් තම ජීවිත පාලනය කරණු ලබන ලිංගභේදවාදී සමාජමය පුරුදු පිළිබඳව සාකච්ඡාවට බඳුන් කර තිබේ. සේවා නියුක්තියේ හිමිකම අහිමිවීම, දරිද්‍රතාව, අධ්‍යාපනය අහිමිවීම සහ එල්ලවන අනෙකුත් පීඩාවන් හේතුවෙන් බාලවයස්කාර විවාහ හා බාලවයස්කාර ගැබ් ගැනීම් අනුපාතයන්ගේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. බලහත්කාරයෙන් LTTE යට බඳවාගැනීමෙන් වැළකී සිටීමේ අරමුණින් තරුණ ගැහැණු ළමයින් ඉතා ඉක්මනින් විවාහ කරදීම් සිදු වූ උතුරු නැගෙනහිර පළාත්වල සුවිශාල ලෙස ළමා මව්වරුන්ගේ අනුපාතය ඉහළගියහ. පශ්චාත් යුද සමය තුළ පවා විවාහය කාන්තාවකට ඉතාමත් පීඩාකාරී තත්ත්වයක් බවට හැඟීම් ශේෂ කරමින් මෙම බාලවයස්කාර කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයන් දරුවන්ගේ වගකීම් පැහැරහරිමින් ඔවුන්ව අතරමංකොට හැරයාම හේතුවෙන් මෙම කාන්තාවන්ගේ ජීවිත අස්ථිර තත්ත්වයකට පත්කොට තිබේ. කාන්තාවන් හා ඔවුන්ගේ පවුල් තව තවත් පීඩාවට පත්කිරීමට සමාජ ජාලයේ දිරාපත්වීම, අන්තර් ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස පවතින පුරුෂ හිඟය සහ අසාධාරණ දෑවැදි ඉල්ලීම් ආදිය ද හේතුසාධක වී ඇත. එබැවින් අවිශ්වාසනීය පුද්ලගලයන් හට කාන්තාවන් විවාහ කරදීම තුළින් කාන්තාවන් තවදුරටත් දුර්වල වී තිබේ. දේපල හිමිකමට ඇති අයිතිය සීමාවීම හා ස්වාමිපුරුෂයා විසින් ආදායම් පාලනය කිරීම ලිංගභේදය පදනම් කරගෙන සිදුකරන සීමා කිරීම් නව ප්‍රවණතාවන්ය.

මූල්‍යමය ගැටලු පවුලේ වගකීම දරන කාන්තාවන් තවදුරටත් මානසික හා සමාජීය පීඩාවන්ට ලක් කරන්නකි. තම පවුලට ආර්ථික සහභාගීත්වය ලබාදීමට නොහැකිවීම නිසා බොහෝ කාන්තාවන් විදේශගත රැකියා ලබා ගැනීමට උත්සහ දරනු දැකගත හැකිය. මේ නිසා දුෂ්කර තත්ත්වයන්ට මුහුණදීමට මෙම පවුල්වලට සිදුවේ. (දරුවන් පිළිබඳව සැලකිල්ල අඩුවීම, විවාහ කඩාකප්පල් වීම, මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමල මව්වරුන් විදේශ රැකියා සෙවීමේ කාර්යයයේ නිරතවන අතරතුර දරුවන් අපයෝජනයට ලක්වීම) වතු ආශ්‍රිත දිස්ත්‍රික්කයේ ජීවත්වන කාන්තාවෙ-ා් (මෙම ව්‍යාපෘතිය නිරූපණය කරන ලෙසට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජීවත්වන කාන්තාවන්) ඉතා දැඩි සමාජ, ආර්ථික හා දේශපාලන බලය දුර්වල කිරීමකට මුහුණ දෙති. ඔවුන් විස්තර කරන ආකාරයට ඔවුන්ගේ නින්දිත රැකියා වාතාවරණය, ප්‍රමාණවත් නොවන වාසස්ථාන, අවම වැටුප්, අධ්‍යාපනයට අවස්ථාව අහිමිවීම, අවිධිමත් ලිපි ලේඛණ වහල් භාවයට නෑකම් දක්වන හෙතුන්යි අඛණ්ඩ දේශපාලනික නොසලකා හැරීම් යන කරුණු මත වතු කම්කරු කාන්තාවෝ ව්‍යුහාත්මක ලෙස අසමාන සැලකීමකට බඳුන්වෙති. ඔවුහු තම දරුවන්ගේ අනාගතය යහපත් කිරීමේ අරමුණින් තම පවුල අතහැර යන තත්ත්වයක බොහෝ සෙයින් පත්ව සිටිති. උතුරු නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක වන කොල්ලකාරී ණය දෙන වැඩසටහන් හේතුවෙන් ද කාන්තාවෝ ආර්ථිකමය වශයෙන් දුර්වල වී සිටිති. සමහර කාන්තාවන් මෙම ව්‍යාපෘති හරහා විවිධාකාර වූ ණයලබාගැනීම හේතුවෙන් ඒවා පියවාගැනීමට නොහැකිවීම හා ණය එකතු කරන්නන්ගේ හිරිහැර නිසා මානසික පීඩාවන්ගේ අන්තයටම පත්ව ඇත.

"ණයක් ලබාගෙන එය නැවත ගෙවීමට නොහැකිව සිටි අම්පාර ප්‍රදේශයේ කාන්තා-වක් නිතරම හුදෙකලාව විසීමට ප්‍රිය තාවයක් දැක්වූ අතර ඇයගේ ස්වාමියා හා පුත්‍රයා ඇයට ණය ගෙවීමේ බර ඉතිරිකර පලාගොස් සිටී.





ඇය තම මාපියන්ගේ නිවාස කරා ගිගොස් වාසය කළාය. ට සෑමවිටම අවශ්‍ය වූයේ තනිව සිටීමටයි. අවසාන ප්‍රතිඵලය වූයේ ඇය කිසිඳු අමුත්තෙකු හමුවීමට අකමැති විමයි. තවද තමාට රෝගයක් ඇතිබව ඇය නිතර සිතන්නට ද වියී කෙසේ වුව ද දැන් ප්‍රදේශවාසීන් ඇය රෝගී කාන්තාවක් ලෙස හංවඩුගසා තිබේ.

- අම්පාර-

"ත්‍රිකුණාමලයේ කන්තලේ ප්‍රදේශයේ ජීවත් වූ 56 හැවිරිදි කාන්තාවක් 36%ක පොලී අනුපාතිකය යටතේ ලබාගත් ණය ගෙවාගත නොහැකි වීම නිසා තම මරණයෙන් පසු අනාථ වේ යැයි සිතු මිණිබිරිව ද ඝාතනය කර ඇය සියදිවි හානි ගරගෙන තිබේ" - ත්‍රිකුණාමලය

මෙහි දක්නට ඇත්තේ මානසික වද වේදනාවන්ට හේතු වූ කාරණා සමූහයකී ආරක්ෂක, සමාජීය හා දේශපාලනික වශයෙන් නොසලකා හැරීමට ලක්වීම මෙම ප්‍රජාවන්ට තම දෛනික ගැටලු අභිබවා යමින් සුභදායි අනාගතයට පියමැනීමට ඇති ඉඩකඩ අහුරා ඇත.

## 5. ළමුන් සම්බන්ධයෙන් සළකා බැලීම

අපගේ මෙම සමීක්ෂණයෙන් ලැබෙන තොරතුරුවලට අනුව කාන්තාවන්ගේ සුබසෙත සහ යහපැවැත්ම දරුවන්ගේ යහපැවැත්ම සමග බද්ධ වී ඇත. හම්බන්තොට, නුවරඑළිය වැනි දුෂ්කර ප්‍රදේශවලත මෙන්ම යුද්ධයේ ඍජු පීඩාවට ලක් වූ අම්පාර, වවුනියාව, මන්නාරම වැනි දිස්ත්‍රික්කයන් හි වැන්දඹුභාවයට පත් වූ කාන්තාවන්ට ද විවිධ හේතුන් මත පවුලේ බර දැරීමට සිදු වූ කාන්තාවන්ට ද බොහෝ වද වේදනාවන්ට මුහුණදීමට සිදුව ඇත. ඔවුහු ස්ථිර ආදායමක් උපයාගැනීමට තරම් කායික හෝ අධ්‍යාපනික සුදුසුකම් අහිමිවීම මත තම දරුවන්ගේ ඕනෑ එපාකම් සැපිරීමට නොහැකිවීම මත මානසික බිඳවැටීමට ලක්ව සිටිති. ගැටුම් පැවති ප්‍රදේශවල අවතැන් වූ දරුවන්ට රජය විසින් අධ්‍යාපනය ලබාදීමත් ඔවුන්ගේ අවශ්‍යතා සැපිරීමටත් කටයුතු කිරීමේ තත්ත්වය තුළ තමන්ට හා තම දරුවන්ට එකී අවකාශයක් මගහැරී යාම ඔවුන්ගේ කනස්සල්ලට හේතු වී ඇත. බොහෝ කාන්තාවන්ගේ විශ්වාසය වන්නේ තමන්ට තම දරුවන් මැනවින් ආරක්ෂා කරගැනීමට හැකියාවක් නොමැති බවයි. ගාල්ල ප්‍රදේශය නියෝජනය කළ කාන්තාවන් සඳහන්කළේ එම ප්‍රදේශයේ ළමා අපචාරබහුලව සිදුවීම තුළ තම දියණියන්ගේ ආරක්ෂාව පිළිබඳ අවදානමකට මුහුණ පා සිටින බවයී හම්බන්තොට ප්‍රදේශයේ කාන්තාවන් පෙන්වා දෙන්නේ කුඩා කලදී ම තම දරුවන් පියාගේ වියෝවය හරහා සමාජීය මෙන් ම මානසික වශයෙන් ද දුකට, වේදනාවට හා හුදෙකලාව බවට පත්ව සිටින බවයී අනෙකුත් දිසත්‍රික්කවල ද මීට සමාන තත්ත්වයක් දක්නට ලැබෙන අතර, ඔවුන් මුහුණපාන ගැටලුවලට වරද මව වෙත පටවමින් දරුවන් තමන් වෙතින් ඈත්වන බව ප්‍රකාශ විය. එමෙන්ම මෙම දරුවන් දෛනිකව මුහුණපාන අත්දැකීම් හේතුවෙන් අපරාධයක් හා ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා යොමුවන ආකාරයන් ද හඳුනාගත හැකිය. හම්බන්තොට ප්‍රදේශයේ කාන්තාවන් ප්‍රකාශ කරන ආකාරයට කාන්තාවන්ගේ යහපැවැත්මේ හා ඔවුන්ගේ ජීවිතයේ මූලිකත්වය පවතින්නේ තම දරුවන්ගේ යහපැවැත්ම ගොඩනැංවීම මතය.

"පශ්චාත් යුද සමයේ දී අගතියට පත් කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට තවත් යුද්ධයක් කිරීමට සිදු වුණි. එනම් ඔවුන්ට තම පවුලේ පැවැත්ම උදෙසා සමාජය සමග අරගල කරන්න සිදු වීමයී ඔවුන්ට තම දුක් වේදනාවන් සාමාන්‍ය කරගැනීමට හැකිවූයේ අවම වශයෙනි.

-ත්‍රිකුණාමලයේ ද්‍රවිඩ කාන්තාවක්-

අනෙක් අතට වගකීම් දැරීමට ඇති හැකියාව ඔවුන්ගේ දරාගැනීමේ ශක්තිය වර්ධනය කිරීමටත්, ප්‍රතිසාධනය හා අධිෂ්ඨානශීලිත්වය වර්ධනය වීම කෙරෙහිත් හේතු වී ඇත. බොහෝ කාන්තාවන් ප්‍රකාෂ කරසිටියේ යුද්ධය හරහා ඔවුන් වඩාත් ශක්තිමත් හා අධිෂ්ඨානශීලි වූ බවයි. විශේෂයෙන් ම තම සැමියන් එතෙක් දරා සිටි වගකීම් තමන් වෙත පැවරීම හරහා ඔවුන් සාම්ප්‍රදායිකව පිරිමින් ට උරුම වූ රැකියා ක්ෂේත්‍ර වෙත ද යොමුවීම සුවි-ශේෂීයී මීට අමතරව ඔවුන් රජයේහා ආරක්ෂක අංශ සමග කටයුතු කරමින් තම

අතුරුදහන්වූ ආදරනීයයන් පිළිබඳ තොරතුරු දැන ගැනීමට පටන්ගෙන ඇත. මෙම අධිෂ්ඨානශීලි බව හා දරාගැනීමේ හැකියාව සෑම ජනවර්ග යකටම අයත් කාන්තාවන් කෙරෙහි පොදුවේ හඳුනාගත හැකි විය.

නිර්දේශයන්

**1. ආරක්ෂාවල සුරක්ෂිතතාව සහ අන්තර්ග්‍රහණය කිරීම තහවුරු කිරීම**

ඉහත ආකාරයේ ඔවුන්ගේම අදහස්වලින් ප්‍රකාශවන පරිදි, අනාරක්ෂිත හා අසමානත්මතාව සහිත පරිසරය ඔවුන්ගේ මානසික ප්‍රතිසාධනය කෙරෙහි ප්‍රධාන බාධාවක්ව පවතී. ඔවුන්ට ආරක්ෂාව සැපයීම සහ අනෙකුත් සමාජීය කාර්යයන් සඳහා ඔවුන්ව සහභාගී කරවා ගැනීමත් මූලිකවම සිදු කළ යුතුයි. මෙම දීර්ඝකාලීන ක්‍රියාවලියක් වන අතර, ඒ සඳහා සමාජ සම්බන්ධතාවලත්, සංස්කෘතික වටිනාකම්වල මෙන්ම රාජ්‍යය ආයතනයන්හි ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීමත් අත්‍යාවශ්‍ය වන ක්‍රියාවලියකි. නමුත් මෙය යුක්තිය සඳහා යන ගමනක් වන බැවින්. ආරක්ෂාව සුරක්ෂිත කිරීම හා සමාජීය ප්‍රවේශවීමට ඉඩ සැලසීම යන අවශ්‍යතා අවස්ථා දෙකක් ඔස්සේ ක්‍රියාත්මක කළ යුතුයි.

පළමුව යුද්ධයෙන් ඇති වූ සෘජු ගැටලුවලට හා පීඩාවන්ට පිළිතුරු සෙවිය යුතු අතරින් එහි දී ගැටුම් හා ප්‍රචණ්ඩ ක්‍රියාති, අතුරුදහන්වීම්, මිලිටරිකරණයි, දේශපාලනික බලපෑම් මත සිදුවන නොතකා හැරීම් මෙන් ම ළමයින්ගේ අධ්‍යාපනය අඩාළ වීම්, උග්‍ර දිළිඳුබව, කළුකඩ වෙළෙඳාම් වැනි ගැටලුවලට යුක්තිය සැපයීම ශක්තිමත් කර පීඩාවට පත් වූවන්ට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයට අවතීරණ කරවීම හරහා පිළිතුරු සෙවීම කළ යුතුය.

දෙවන පියවර වන්නේ කාන්තාවන්ට අනාරක්ෂිත බව අවම කිරීමට පියවර ගැනීමයි. මේ සඳහා කාන්තා අයතිවාසිකම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සිදු කළ යුතුයි. එමෙන්ම ස්ත්‍රී දූෂකයන්ට හා ළමා අපචාරන් සිදුකළ අයට ඉක්මනින් හා දැඩි දඬුවම් පැමිණවීමට නීතිය ක්‍රියාත්මක විය යුතුය. එලෙසම විවාහය සඳහා නිශ්චිත අවම වයසක් දැක්වීමත්, සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ දැනුවත් කිරීමත්, වැන්දඹු කාන්තාවන් මුහුණදෙන ගැටළු පිළිබඳ සමාජය දැනුවත් කර එම තත්ත්වයන්ගෙන් ඔවුන් ගලවා ගැනීමත් සිදු කළ යුතුයි. මේවා සංක්‍රාන්තික යුක්තිය කරා යන ගමනේ දී එකවර ළඟා කරගත් නොහැකි ක්‍රියාවන් වන නමුත් මෙකී ක්‍රියාවලිය හරහා යුක්තිය වඩා හොඳින් තහවුරු වීමට හා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරමින් සුරක්ෂිත සමාජයක් ගොඩනැංවීම හැකියාව උදා වේ.

**2. මානසික සෞඛ්‍යය සේවා පහසුවෙන් ලබාගැනීම වැඩිදියුණු කිරීම සහ මනෝ සමාජ ප්‍රතිසාධනය**

පීඩාවට පත් කාන්තාවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත මානසික සෞඛ්‍යය සේවාවන් සැපයීමත්, මනෝ සමාජීය සහායයන් ලබාදීමත් හරහා ඔවුන් ප්‍රතිසාධනය කිරීමට යොමු විය හැකිය. මේ වන විට ශ්‍රී ලංකාවේ පුහුණුවලත් වෛද්‍යවරුන් 58 දෙනෙක් සහ හෙදියන් 56 දෙනෙක් පමණක් සේවයේ නියුක්ත වන අතර, ඒ අනුව පැහැදිලි වන්නේ පුද්ගලයන් 25,000කට එක් පුහුණුවලත් මානසික සෞඛ්‍යය නිලධාරියෙක් සිටින අතර, සෑම දිස්ත්‍රික්කයකටම පුහුණුවලත් මනසික සෞඛ්‍යය නිලධාරීන් 4 දෙනෙකුටත් අඩු පිරිසකගේ සේවය සැපයෙන බවයි. මානසික සෞඛ්‍යය සේවකයන් බඳවා ගැනීමත්, ඔවුන් පුහුණු කිරීමත්, ඉහළ නැංවිය යුතු අතර, ඔවුන්ව මෙවැනි ප්‍රශ්නගත ග්‍රාමීය ප්‍රදේශවල සේවය සඳහා යෙදවීමත්, ඉතා වැදගත්ය. ගාල්ල සහ ත්‍රිකුණාමලය ප්‍රදේශවල කාන්තාවන් තම ප්‍රජාවන් අතර පවතින සෞඛ්‍යය ගැටළු පිළිබඳ දැඩි කනස්සල්ලට පත්ව සිටිති එමෙන් ම පුහුණුවලත් ජංගම මානසික සෞඛ්‍යය සේවාවන් පවත්වාගෙන යාමත් රජයේ ආයතනික ව්‍යුහයන් වන ග්‍රාමනිළධාරී කාර්යාල, කාන්තා සංවර්ධන කාර්යාල ආදීය හරහා ක්‍රියාත්මක කළ හැකිය. තවද පිඩාවට පත් වූ කාන්තාවන්ට පිහිට වීමට පුහුණුවලත් සමාජ ක්‍රියාකාරීන් මගින් නායකත්වය සැපයීමත් පුද්ගල හදිසි අවශ්‍යතා හඳුනාගෙන ඒ මත ආධාර දැක්වීමේ අවශ්‍යතාව ඉහත දිස්ත්‍රික් දෙකම නියෝජනය කළ කාන්තාවන්ගේ යෝජනා විය.

“මට තවමත් මගේ සැමියාව L.T.T.E සංවිධානය මඟින් මරාදැමූ දිනය මතකයි. මම දන්නෙ නෑ ඇයි ඔවුන් මගේ සැමියාව මරාදැමුවේ කියා. ඔහුට කිසිම සතුරෙක් සිටියේ නෑ. ඒ වගේම ඔහු L.T.T.E එකට විරුද්ධව කිසිම දෙයක් කළේ නෑ. ඔහු යුද්ධෙයට මුහුණ දුන් තවත් එක අසරණ වින්දිතයෙක් පමණයි. ඔහු තමයි මගේ ලෝකය වුනේ. මම සම්පූර්ණයෙන් මා යැපුණේ ඔහුගෙන් නමුත් මට වයස අවුරුදු 23 වෙනකොට මම දියණියන් දෙදෙනෙක් සහිත වැන්දඹුවක් බවට පත් වුණා. දැන් මට වයස අවුරුදු 60ක් වෙනවා. ඔහු මිය යනවිට මම තනිව නගරයට යාමට පවා දැන සිටියේ නෑ. සමාජය ගැන මම කිසිම දෙයක් ඒ වෙනකොට දැනන් හිටියේ නෑ.

මට තවම මතකයි ඔහු මිය ගිය ඒ දිනය. ඔහුගේ රාත්‍රී ආහාරය බෙදා තබන ලෙස පවසා ආසන්නයේ වෙසෙන තම මවගේ සුවදුක් විමසා පැමිණීමට යාමට අවශ්‍ය බව පැවසුවා. මම ඔහු සමඟම රාත්‍රී ආහාර ගැනීමට ඔහු එනතුරු මැදියම පසුවනතෙක් බලා සිටියා. නමුත් ඔහු නැවත පැමිණියේ නෑ. එළිය වැටුනට





පස්සේ මම ඔහුගේ ඥාතීන් සිටින දිහාවට ගියා ඔහුව සොයාගෙන. නමුත් ඔහු එහි නොපැමිණි බව ඔවුන් පැවසුවා. පසුව ඔවුන් විසින් සැමියාගේ මළ සිරුර සොයාගත්තා. ඔවුන් මට පැවසුවා මළසිරුර දෙස නොබන ලෙසයි. එහෙත් මට අවශ්‍ය වුනා රාත්‍රී ආහාරය ගැනීමට නැවත නිවසට එන බව පවසා ගිය මගේ සැමියාගේ මුහුණ බැලීමට. ඒ දසුන මට කිසිම දාක අමතක වෙන්නේ නෑ. මම කෑ ගහල හඬා වැළපුනා ඔවුන් මගේ සැමියා මෙලෙසින් මරාදැමීමට හේතුව කුමක්දැයි අසමින්. ඉන්පසු මම දැඩි කම්පනයට හා මානසික ආතතියට ගොදුරු වුණා. තවමත් මම ඒ සඳහා ප්‍රතිකාර ලබනවා.

මගේ ඥාතීන් ඔවුන්ට හැකි පමණින් මට උපකාර කළා. නමුත් මට මගේ සැමියා දැරූ වගකීම දරාගනිමින් මගේ කුඩා දූවරු දෙදෙනා රැක බලාගැනීමට සිදුවුණා. අධ්‍යාපනයක් හෝ ලෝකය පිළිබඳ කිසිත් නොදන්නා මම වගේ ගැහැණියකට එය කිසිසේත්ම පහසු වෙන්නෙ නෑ. මට හැකි උපරිමය දරන්න හුරු වුණා. ඉන් පෙර කිසිදිනක අම්පාර නගරයට ගොස් නොසිටි මම තනිව එහි ගොස් රජයේ නිලධාරීන්ට මගේ තත්ත්වය පහදා දී සහන ලබාගැනීමට කටයුතු කළා. ඒ වගේ ම විවිධ සමාගම් හා රැස්වීම්වලට සහභාගී වීම හරහා සමාජය පිළිබඳ ඉගෙනගැනීමේ වැදගත්කම් අවබෝධ කරගත්තා. අද මම මේ විදිහට ජීවත්වන්නේ මගේ දරුවන්ගේ යහපත සඳහා මම වගකීම් දරා කටයුතු කළ යුතු බව තේරුම්ගත් නිසයි. මම තවම අකුරු ලිවීමට හෝ කියවීමට දන්නේ නෑ. නමුත් අභියෝගයන්ට මුහුණ දෙමින් සමාජයේ ජීවත්වන ආකාරය මම ඉගෙනගත්තා. මම වගේ ම මේ තත්ත්වයන්ට මුහුණ දුන් සහ මුහුණදෙන කාන්තාවන් ධෛර්යයමත් කරන්න මට දැන් අවශ්‍යයයි. ධෛර්යය කියන් දේ කවුරුත් අපට ගෙනත් දෙන දෙයක් නෙවෙයි. එය අප තුළම තියෙන ගොඩනගා ගතයුතු දෙයක් කියලයි මම හිතන්නේ"

**-අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් කාන්තාවකගේ අත්දැකීම් බෙදාගැනීමක්-**

"මගේ ප්‍රතිකාර තුලින් ඔවුන්ට මානසික වශයෙන් සුව කිරීමට හැකි නම් අහිමි වූ දෑ අමතක කර නැවත නැගීසිටීමට ඔවුනට හැකිවේවි. "

**-මහනුවර කාන්තාවක්-**

### 3. ප්‍රජා පාදක සුවපත් කිරීම්

මෙම ව්‍යාපෘතිය තුළින් පෙන්වා දෙන්නේ ප්‍රජා පාදක සුවපත් කිරීමේ වටිනාකමයි. කාන්තාවන් අතර සිදුවූ සැලසුම්කිරීමේ හමු සහයෝගීතාවය දක්වන කණ්ඩායම් ලෙස ක්‍රියාත්මක වීමට ආරම්භ විය. කාන්තාවන් තම අත්දැකීම් හුවමාරු කරගැනීම තුළින් ඉමහත් සහනයක් ලබාගත් අතර හා සමාන තත්ත්වයේ සිටින කණ්ඩායමක් සමග ප්‍රෙයෝජනවත් ක්‍රියාකාරකම් තුළින් ද කාන්තාවන්ට ඉමහත් සහනයක් ළඟාකර ගත හැකි බවයි. මෙමඟින් කාන්තාවන්ගේ පුද්ගලික අභියෝගයන් වන දරිද්‍රතාවය, තනිකම, අපකීර්තියටපත් ජීවිත, වැන්දඹුභාවය පවුල් වගකීම් හා සමාජ වගකීම් සලකා බැලේ. සමාජ ජාලය තුළ මොවුන්ගේ හැසිරීම විමර්ශනය කරනු ලැබේ. යමක් පැවසීමට ඇති හැකියාව, ගැටලු සම්බන්ධයෙන් ඇති අත්දැකීම් ආදියේ ආන්තික අසමානතාවයන් මෙම ව්‍යාපෘතිය තුළින් නිරාකරණය කෙරේ. කාන්තාවන් මුහුණපාන මානසික ආතතීන් හා පීඩාවන්තුළින් තමන් සතු දුර්වලතාවයන් හඳුනාගෙන ඒ හරහා ලබාගන්න පරිණත බව මූලික කරගෙන දුක්කම්කටොළු ජයගැනීමට හා සහයෝගීත්වය තුළින් පොදු ගැටලු රාජ්‍ය අංශයේ සම්පත් ද යොදාගෙන නිරාකරණයට හැකියාව ලැබේ. කාන්තාවන්ගේ මානසික සුවය උදෙසා වැදගත් මූලාශ්‍රයක් සැපයීමට ප්‍රජා මූලික උපකාරක කණ්ඩායම්වලට හැකියාව ඇති එය අඩු පිරිවැයක්සහිත, පහසුවෙන් සංවිධාන කළ හැකි මානසික සෞඛ්‍ය සඳහා වන ආයතනික සම්පත් හිඟය අවම කරගත හැකි ක්‍රමවේදයකි උපකාරක කණ්ඩායම් සාමාජිකයන්ගේ අධ්‍යාපනය හා පුහුණු උපදේශකවරුන් වෙත ප්‍රවේශවීමට ඔවුනට ඇති හැකියාව වර්ධනය කිරීම (ඉහත යෝජනා කරන ලද ජංගම සේවය වැනි දේ) තුළින් සියලු

සාමාජිකයන් හට ප්‍රතිලාභ හිමිවනු ඇත.
"බොහෝ කාන්තාවන් මෙන් ම කණ්ඩායම් අතර පවතින මානසික තුවාල සුව කිරීමට සියලුදෙනා එක්ව අවකාශයක් ගොඩනගා එම ගැටලු විසඳිය යුතුය. හැම කාන්තාවක් ම තනිව වැලපේ. නමුත් සියලුදෙනා එක්ව එකිනෙකා ශක්තිමක් කරගනිමින්. එකිනෙකාට උපකාර කරගනිමින් මෙම තුවාල සුවකර ගැනීමට හැකිවනු ඇත"

## 4. ආඛ්‍යානය

අප්‍රසන්න අවස්ථාවක් පිළිබඳ කතාන්දර ගොඩනැගීමට හැකිවීම කතාන්දර කීමේ හැකියාවේ වැදගත් පියවරකි. අප්‍රසන්න හැඟීම් පාලනයටත්. අත්දැකීම් පෙලගැස්වීමටත්. නිර්මාණාත්මක දෘෂ්ඨී කාල්පණිකයන් ගොඩනැගීමටත් මෙය උපකාරී වේ. ජාතික මට්ටමේ දී මෙම ආඛාන සංක්‍රාන්තික යුක්තිය කරා පැමිණීමේ දී වැදගත්තොට සැලකේ. වින්දිතයන් ලෙස මෙන් ම රටක් වශයෙන් ප්‍රතිසාධනය කරා ගමන් කිරීමේ දී කථා කිරීමට හා අසා සිටීමට අවකාශ සකස් කරදීම අත්‍යාවශ්‍ය වන බව පෙනේ.

පුහුණු උපදේශකවරුන් හට සැලසුම් කරන ලද මගපෙන්වීම් යටතේ වාර්තාකරණයට හා හෙළිදරව් කිරීම්වලට ඉඩ සැලසීම සිදුකරනු ලැබේ. කෙසේ වුවද මෙම ක්‍රමවේද සැමවිටම නොපවත්නා බැවින් කාන්තාවන් තම අත්දැකීම් තම ප්‍රජාවේ අන්‍යන් හා ප්‍රකාශ කිරීමත් පෞද්ගලික දිනපොතක් පවත්වාගෙන් යාමත් ඔවුන්ගේ නිහඬ අත්දැකීම් එහි ලිවීමත් ඔවුනට දෛනිකව මුහුණදීමට සිදුවන පීඩාවන් මගහරවා ගැනීමට ගත හැකි පියවරයන් ලෙස යෝජනා කළ හැකියි එමෙන් ම ඔවුන් වර්තමානයේ ලද ජයග්‍රහණයන්ගෙන් පෙන්නුම් කරන්නේ ඔවුන් සිටි බේදජනක තත්ත්වයන්ගෙන් ඔවුනට මිදීමට හැකි වූ ප්‍රමාණයන් ය. ඔවුන් පවසන ආකාරයට මෙහි දී ඔවුනට හැඟෙන්නේ තමපපුව මත තිබූලොකු බරක් අත්හල ආකරයකි.ඔවුනට තම ප්‍රශ්න කවුරුන් හෝ සමඟ කතා කිරීමට අවශ්‍යයි. තමන් මීට වඩා තරුණව සිටියානම්, තමන්ට පැහැදිලි අනාගතයක් බලාපොරොත්තුවීමට හැකි වූවානම්, යන සිතුවිලි ඔවුන් අතර දක්නට ලැබෙයි. තවද, ඔවුනට ස්වකීයන්ගෙන් වෙන්ව ජීවත්වීමේ වේදනාවක්, තමන් විඳි බියසුලු අත්දැකීම් හා මතකයන්ගෙන් සහනයක් ලබාගැනීමටත් අවකාශය හිමිවේ. එමෙන්ම දිනපොත හරහා ඔවුන්ගේ වේදනාබර හැඟීම් හා ඔවුන් මුහුණපාන අභියෝගයන් අවම කරගනිමින් තම අනාගත බලාපොරොත්තු ලෙස නැවත හැරී බැලීමටත් ඒවා ළඟා කරගැනීමටත්, තමන්ටම අවේණික වූ කුසලතාවයන් හඳුනාගැනීමටත්, අන්‍ය කාන්තාවන් සමඟ සහයෝගීව කටයුතු කිරීමට අත්තිවාරම් දමා ගැනීමට මෙම ක්‍රියාවලිය හරහා මඟ පාදනු ලබයි. මෙය කාන්තාවන්ගේ මානසික ප්‍රතිසාධනය නගාසිටුවීම කෙරෙහි වැදගත් කාර්යයන් ඉටුකරනු ලබයි.

## 5.ස්මරණයන්

සිහිකිරීම සහ ශෝක වීම ප්‍රතිසාධනයෙහි වැදගත් අවස්ථාවක් ලෙස හඳුනාගත හැක. සෑම දිස්ත්‍රික්කයකම කාන්තාවෝ වාර්ගික භේදයකින් තොරව මෙහි වැදගත්කම ප්‍රත්‍යකෂ කළහ. විශේෂයෙන් ම අම්පාර, වවුනියාව, මහනුවර, හම්බන්තොට, මන්නාරම යන දිස්ත්‍රික්ක නියෝජනය කළ කාන්තාවන් මෙම සැමරීමේ කාර්යය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළහ. අනුස්මරණය සඳහා ස්මාරක, මහජන සැමරුම්, කෞතුකාගාර, ගුණ සැමරුම් යනාදිය ප්‍රමුඛව දක්නට ලැබේ. පශ්චාත් ගැටුම් ප්‍රතිසාධනයේ දී සෑම ජන ප්‍රජාවක් අතරම මෙය සමාන ලෙස සිදුවූවහොත් අතීතය සමඟ යළි ගොඩනැගීමටත් බෙදුණු ප්‍රජාවන් යළි සමගි කරවීමටත් මේ හරහා ඉඩකඩ ලැබේ. මෙහි දී වාර්ගික වෙන්වීමකින් තොරව සැමට එකට එක්ව තම අතීතයන් වෙනුවෙන් දුක්වීමට හා සිහි කිරීමට ඉඩ සැලසිය යුතුය. කාන්තාවන්ට තම දරුවන් කැටුව මෙවැනි සිහිකිරීම්වලට සම්බන්ධවීමට හැකියාව ලැබීම මඟින් දරුවන්ට තම මියගිය පියවරුන් පිළිබඳ මතකය ආවර්ජනය කිරීමට මෙන් ම ඔවුන් පිළිබඳ ආඩම්බර හැඟීම් ජනිත කරගැනීමටත් හැකියාව උදාවේ. විශේෂයෙන් ම මෙම අනුස්මරණයන් සෑම ප්‍රජාවක් කෙරෙහිම සංවේදී වියයුතු අතර, ඒවා හුදු ප්‍රීති උත්සව හෝ උදාන ප්‍රකාශවලින් යුතු හා හමුදා මැදිහත්වීම්වලින් යුතු සැමරුම් වෙනුවට ජනතාවට අතීතාවර්ජනය හරහා තම ශෝකය බෙදාගැනීමට ඉඩහල යුතුයි. වර්තමානයේ පෙර පැවති ජයග්‍රහණයේ සැමරුම් දින වෙනුවට යුද්ධය නිමා වීම සිහි කිරීමේ දින පැවැත්වීම වර්ධනීය ලක්ෂණයක් ලෙස පැසසිය යුතුයි. ආගමික හෝ සමාජීය භේදයකින් තොරව L.T.T.E සංවිධානයේ සිටියවුන්ට පවා මෙම සැමරීම් කාර්යයට එක්ව නිරතවීමට අවස්ථාව හිමිකර දිය යුතුයි. සෑම ජනකොටසක්ම එකට එකතු කරගෙන සිදුකරනු ලබන මෙවැනි සැමරුම් හරහා යුද්ධයෙන් සිදු වූ පුද්ගල අහිමිවීම් පිළිබඳ ජනතාවට නැවත සිතා බැලීමට අවකාශ්‍ය උදා කරදෙන අතර වෙන්ව සිටි ජනතාව එකම ජාතියක් වශයෙන් නැවත එකතු වීමට මංපෙත් හෙළිකරදීම ද සිදුවේ.

යුද්ධය නිසා විපතට පත් අන්‍යයන් මෙන් ම වද හිංසාවට ලක්ව ලැජ්ජාව හා බිය නිසා නිශ්ශබ්දව සිටින්නන්ට ද තම අත්දැකීම් ප්‍රකාශ කිරීම හරහා සහන ලබාගැනීමටත් ඔවුන්ගේ ආරක්ෂාව සඳහා රජයේ සෞඛ්‍ය ආරක්ෂක හා අධිකරණ පද්ධතීන් වෙත වගකීම් පැවරීමත් ඒ සඳහා පුළුල් බලගැන්වීමක් සිදුකිරීමත් වැදගත් වේ. එමෙන් ම පීඩාවට පත්වූවන්ගේ ප්‍රශ්නවලට සවන්දීම ඔවුන් ප්‍රතිසාධනය කිරීමට හැකි තවත් ආකාරයකි.

Briefing Paper No- 5, December 2016
Published by: National Peace Council- 12/14 Purana Vihara road, Colombo 6, Sri Lanka.
Tel:+94 112 818 344, 0112 854 127 Fax: +94 112 819 064
Web: www.peace-srilanka.org

All rights reserved. Material from this publication maybe used with due credit to the National Peace Council.
Thanking Ms. Mariyahl M. Hoole for drafting the Briefing Paper.

Supported by

FOKUS
FORUM FOR WOMEN AND DEVELOPMENT